# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති
## (සංශෝධන)

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[214 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, නිශ්චිතව හඳුනාගනු ලැබූ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත සහ 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යන පනත්වලට අදාළ වීමෙන් නිදහස් කිරීම වේ.

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති
## (සංශෝධන)

එල්.ඩී.—ඕ. 11/2013.

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 2013 අංක ..... දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2008 අංක 14 දරන පනතේ උපලේඛනය සංශෝධනය කිරීම.

**2.** 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ, උපලේඛනයේ 10 වන අයිතමයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීම මගින්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"11. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත.

12. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.